# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2197/21 - 2020 ඔක්තෝබර් මස 15 වැනි බ්‍රහස්පතින්දා - 2020.10.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශුද්ධි පත්‍රය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියට අනුව නගර සැලසුම් හා ජලසම්පාදන අමාත්‍යවරයා විසින් 2018.03.22 දිනැති හා අංක 2063/36 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ 2A හා 3A පිටුවල අංක 04 - 274 යටතේ පල කරන ලද නිවේදනයේ උපලේඛනයෙහි ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මහරගම ලෙස සඳහන් වුවත් එය කැස්බෑව ලෙස ද, ග්‍රාම නිලධාරි වසම අංක 532 C වත්තේගෙදර ලෙස සඳහන් වුවත් එය අංක 533 D නැගෙනහිර බොරලැස්ගමුව ලෙස ද නිවැරදි විය යුතු බව 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජල සම්පාදන අමාත්‍ය වාසුදේව නානායක්කාර වන මම මෙයින් ප්‍රකාශයට පත් කරමි.

වාසුදේව නානායක්කාර,
ජල සම්පාදන අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 07 වැනි දින,
යොමු අංකය : 5/2/2/1309

ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැඳුර",
35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

10-1119

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට උණවටුන අපජල කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ අංක 6 පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින් මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

වාසුදේව නානායක්කාර,
ජල සම්පාදන අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 07 වැනි දින,
යොමු අංකය : 5-2/GL/21

ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැඳුර",
35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

ගාල්ල දිස්ත්‍රික්කයේ හබරාදුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 137B යක්දෙහිමුල්ල, ග්‍රාම නිලධාරි වසමේ යක්දෙහිමුල්ල ගමේ පිහිටි උණවටුන වෙරළ දෙසට ඇති දේවාල පාරේ අංක 261 නිවාස ඉඩමට යාබද ඉඩමෙන් පර්චස් 15ක් පමණ වන පහත සඳහන් මායිම් තුල වූ ඉඩම් කොටස.

| | | |
|---|---|---|
| *උතුරට* | : | ඕලන්ද ඇල ; |
| *නැගෙනහිරට* | : | අංක 261, දරන නිවාස ඉඩම ; |
| *දකුණට* | : | දේවාල පාර ; |
| *බටහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස හා දේවාල පාර |

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය : සුනිල් පල්ලියගුරු මහතා,
යක්දෙහිමුල්ල,
උණවටුන.

10 - 1118

---

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට රුවන්වැල්ල ජල යෝජනා ක්‍රමයේ ජල ගබඩා ටැංකිය ඉදිකිරීම

සඳහා ඉඩම් කොටසක් අවශ්‍ය ව ඇති හෙයින් මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 07 වැනි දින,
යොමු අංකය : 5-2/KE/06
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

කැගල්ල දිස්ත්‍රික්කයේ, බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 107D පනාපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පනාපිටිය ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එල්. සී. කේ. ලියනගේ මහතා විසින් මැන සකස් කරන ලද සැලසුම් අංක WB/R/2015/004 පිහිටි පරාවත්ත ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 40ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

*උතුරට* : මෙම ඉඩමේම ඉතිරි කොටස ;
*නැගෙනහිරට* : මෙම ඉඩමේම ඉතිරි කොටස ;
*දකුණට* : පාර (වත්ත) ;
*බටහිරට* : පාර (වත්ත) මෙම ඉඩමේ ඉතිරි කොටස.

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය : කැලණිවැලි වැවිලි සමාගම,
අංක 400,
ඩීන්ස් පාර,
කොළඹ - 10.

10 - 1117

---

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, යාපනය - කිලිනොච්චිය ජලසම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ, මලාපවහන පොම්පාගාර අංක 12 ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙ හි නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 07 වැනි දින,
යොමු අංකය : 5/3/JA/01

ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

උතුර පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, යාපනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 81/J, කොටුව (පෝර්ට්) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වන්නාර්පොන්නයි - නිරිත ගමේ පිහිටි, බලයලත් මිනින්දෝරු ඒ. අරුල්නේසන් මහතා විසින් මැන සකස් කරන ලද

අංක 2842 දරන මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 01 වශයෙන් දැක්වෙන පහත සඳහන් මායිම තුළ පිහිටි හෙක්ටයාර් 0.0127 ක් පමණ වන ඉඩම් කොටස :

කැබලි අංක : 01
ප්‍රමාණය : හෙක්ටයාර් 0.0127

මායිම්

*උතුරට* : කාණුව ;
*නැගෙනහිරට* : සුසාන භූමිය ;
*දකුණට* : සුසාන භූමිය ;
*බටහිරට* : අඩි පාර

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය : 01. මහ නගර සභාව,
යාපනය.

10 - 1116

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.